# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2479/22 - 2026 මාර්තු මස 09 වැනි සඳුදා - 2026.03.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පානදුර නගර සභා බල ප්‍රදේශය සහ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් නිරෝෂන් රත්නායක වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 අගෝස්තු මස 15 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, පානදුර නගර සභා බල ප්‍රදේශය සහ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

**බිමල් නිරෝෂන් රත්නායක** (පා.ම),
ප්‍රවාහන, මහාමාර්ග හා
නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 පෙබරවාරි මස 05 වැනි දින,
ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II
බත්තරමුල්ල.


1A - PG 7565 - 18 (2026/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පානදුර නගර සභා බල ප්‍රදේශය සහ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, පානදුර නගර සභා බල ප්‍රදේශය සහ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම 2026ක් වූ පෙබරවාරි මස 05 වන දින, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් නිරෝෂන් රත්නායක වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**බිමල් නිරෝෂන් රත්නායක** (පා.ම),
ප්‍රවාහන, මහාමාර්ග හා
නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 පෙබරවාරි මස 12 වැනි දින,
ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II
බත්තරමුල්ල.

---

**පානදුර නගර සභා බල ප්‍රදේශය සහ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව පානදුර නගර සභා බල ප්‍රදේශය සහ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය, බිමල් නිරෝෂන් රත්නායක මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 පෙබරවාරි 05 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**එම්. ජී. හේමචන්ද්‍ර,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2026 පෙබරවාරි මස 12 වැනි දින,

EOG 03 - 0099

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.